ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

இலங்கை பத்திரிகைப் பேரவை

Sri Lanka Press Council

වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය

ஆண்டு அறிக்கையும் கணக்குகள் கூற்றும்

Annual Report and Statement of Accounts

2020

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය

2020 ජනවාරි 01 - 2020 දෙසැම්බර් 31

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
අංක 155/15, කාසල් වීදිය,
බොරැල්ල, කොළඹ 08.
2020.08.12

ගරු ජනමාධ්‍ය ඇමතිතුමා,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

වාර්ෂික වාර්තාව - 2020

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වැනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුද්‍රණ පනතේ 14 වැනි වගන්තිය අනුව ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

01. 2020 ජනවාරි මස 01 වැනි දින සිට 2020 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා මණ්ඩලයෙන් ඉටු කෙරුණු කාර්ය භාරය.

02. විගණකාධිපතිගේ වාර්තාව.

03. එම කාලපරිච්ඡේදය සඳහා අවසන් ගිණුම් ප්‍රකාශනයේ පිටපතක්.

මෙයට,
විශ්වාසී,

මහින්ද පතිරණ,
සභාපති.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2020

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

1973 අංක 5 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පිහිටුවීමේ පරමාර්ථය වූයේ,

ශ්‍රී ලංකාවෙහි පුවත්පත්වලට අදාළ කරුණු විධිමත් කිරීමට හා ඒ කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීමට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයක් පත් කිරීම සඳහා ද ඇතැම් කරුණු පුවත්පත්වල මුද්‍රණය කිරීමට හෝ පළ කිරීමට අදාළ වැරදි විමර්ශනය කිරීම සඳහා ද ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආයතනයක් ලෙස ය.

2012.01.01 දින සිට අංක: 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 ස්ථානයේ පවත්වාගෙන යනු ලැබී ය.

01. මණ්ඩලයේ සැකැස්ම

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් හත්දෙනෙකුගෙන් (07) සමන්විත වේ. ඉන් එක් තැනැත්තෙකු පත්‍රකලා සංගම් නියෝජනය කරමින් පත් කරන අතර, අනෙක් තැනැත්තා පුවත්පත් ව්‍යාපාරයේ සේවකයින්ගේ සබඳතා නියෝජනය කරන ඍත්තීය සමිති සාමාජිකයින්ගේ නියෝජිතත්වයෙන් පත් කරනු ලබයි. මෙම සාමාජිකයින් 07 දෙනාගෙන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා (වර්තමාන ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා) නිල බලයෙන් පත්වේ. පත් කරනු ලබන දින සිට සාමාජිකයන්ගේ නිල කාලය වසර 03 කි. පුවත්පත් කොමසාරිස්වරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරනු ඇත.

අතිගරු ජනාධිපතිතුමන් විසින් 2020.01.08 වැනි දින සිට පත් කරන ලද මණ්ඩලයේ සභාපති හා සාමාජිකත්වයේ නාම ලේඛනය පහත පරිදි විය.

තනතුර	නම	පත්වූ දිනය
සභාපති	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහින්ද පතිරණ මහතා	2020.01.08
සාමාජික	නාලක කළුවැව මහතා (ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්)	නිල බලයෙන්
සාමාජික	නීතීඥ ගාමිණී විජේවර්ධන මහතා	2020.01.22
සාමාජික	ජනාධිපති නීතීඥ ප්‍රසන්ත ලාල් ද අල්විස් මහතා	2020.01.22
සාමාජික	ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා	2020.01.22

2020.07.07 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස ආරියනන්ද දොඹගහවත්ත මහතා පත්කරන ලදී.

2020.07.06 දින සිට 2020.08.05 වන දින දක්වා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වැඩබලන සභාපතිවරයා වශයෙන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නාලක කළුවැව මහතා පත්කරන ලදී.

2020.09.17 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස කේ.ජී.සී.පී. බණ්ඩාර මහතා පත්කරන ලදී.

02. මණ්ඩලයේ රැස්වීම්

සභාපතිතුමාගේ හා සාමාජික මහතුන්ගේ ප්‍රධානත්වයෙන් මණ්ඩල රැස්වීම් 15 ක් 2020 වර්ෂය තුළ දී පැවැත්විණි.

03. කාර්ය මණ්ඩලය

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව සකස් කරන ලද ආකෘතියට අනුව නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව කාර්ය මණ්ඩලය පහත පරිදි වේ :-

වර්තමානයේ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 19 කි.

1.	ටී. නිරෝෂණ මහතා	පුවත්පත් කොමසාරිස්
2.	යූ.එල්.ඩී.ඒ.එම්.විජයසිංහ මහතා	සහකාර පුවත්පත් කොමසාරිස්
3.	එම්.පී. කුෂාන් දේවප්‍රිය මහතා	ගණකාධිකාරි
4.	කේ.ජී.එන්.එච්.පතිරත්න මිය	පරිපාලන නිලධාරි
5.	එච්.එස්.විජේරත්න මිය	ප්‍රවෘත්ති විමර්ශක (සිංහල)
6.	කේ. ඒ. විනූෂි ශෂිකලා මිය	භාෂා/භාෂණ පරිවර්තිකා
7.	ශාලනි ඒ. ජේ. යෝගරාජා මෙනවිය	ප්‍රවෘත්ති විමර්ශක (දෙමළ)
8.	ටී.ඒ.අනෝමා ප්‍රියන්ති තිලකරත්න මිය	කළමනාකරණ සහකාර
9.	ටී.එන්.නිල්මිණී පීරිස් මිය	ගිණුම් සහකාර
10.	බී.එම්.පී.කේ. සිරිවර්ධන මිය	කළමනාකරණ සහකාර
11.	එන්.ජේ.ඒ.ජේ.ජී. පෙරේරා මිය	කළමනාකරණ සහකාර
12.	ඒ.එස්. නෙරංජී මිය	කළමනාකරණ සහකාර
13.	කේ.එල්. චන්ද්‍රපාල මහතා	රියදුරු
14.	ජී.බී.කරුණාතිලක මහතා	රියදුරු
15.	කේ.ජී.එෆ්.විජේරත්න මහතා	කාර්යාල කාර්ය සහයක
16.	එච්.එස්.එස්. ආනන්ද මහතා	පණිවිඩකරු
17.	ජී. ඉසුරු ධනංජය කරුණාතිලක මහතා	කාර්යාල කාර්ය සහයක
18.	කේ. පී. තිලානි එම්. බණ්ඩාර මෙනවිය	ප්‍රවෘත්ති විමර්ශක (ඉංග්‍රිසි)
19.	වයි. පී. චමල්කා දිල්ශානි මෙනවිය	ලඝු ලේඛක (ඉංග්‍රිසි)

04. පැමිණිලි

2020 වර්ෂය තුළ දී ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව පැමිණිලි පිළිබඳ විභාග 71 ක් ලැබී තිබුණි.
එසේ ම 2013, 2014, 2015, 2016, 2017, 2018 හා 2019 වසරවලින් 2020 වර්ෂයට ඉදිරියට ගෙනෙන ලද මණ්ඩලයට ක්‍රියාමාර්ග ගැනීමට ඇති පැමිණිලි සංඛ්‍යාව 62ක් වේ. එසේ ම ලද පැමිණිලි පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

2013 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන	01	
2014 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන	02	
2015 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන	01	
2016 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන	04	
2017 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන	03	
2018 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන	09	
2019 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන	42	62
2020 වසරේ විභාග කිරීම සඳහා ලද මුළු පැමිණිලි ගණන		71
ඒ අනුව 2020 වසරේ විභාග කළ මුළු පැමිණිලි ගණන		133

ඒ අනුව සමාලෝචිත වර්ෂයේ විභාග කරන ලද මුළු පැමිණිලි ගණන 133කි. එම පැමිණිලි සම්බන්ධයෙන් මණ්ඩලය තීරණ ලබා ගත් ආකාරය පහත සඳහන් පරිදි වේ.

විමර්ශන කටයුතු වෙමින් පවතින	60
විධිමත් ආකාරයට යොමු නොකල ඉදිරි කටයුතු සිදු කරන පැමිණිලි	09
එකඟතාවයට පත් වූ	08
ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ	35
නිෂ්ප්‍රභ කිරීම	17
නියෝග	04
	133

''ඊතලය'' සඟරාවට එරෙහිව ලද පැමිණිලි 11ක් මෙහි අන්තර්ගත වේ.
ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ, වර්ගීකරණය පහත සඳහන් නිර්නායකයන් මත පදනම් විය.

• පැමිණිල්ලේ ඉල්ලීම මත	04
• පැමිණිල්ල විභාග වන අතරතුර පැමිණිලි පාර්ශවය ඒ සඳහා සහභාගි නොවීම.	12
• බහා තබන ලද පැමිණිලි.	01
• පැමිණිල්ල විධිමත් ආකාරයට ඉදිරිපත් කර නොතිබීම	18
	35

තව ද "ඊතලය" සඟරාව සම්බන්ධයෙන් 2013 වසරේ පැමිණිලි 1 ක් ද, 2014 වසරේ පැමිණිලි 2 ක් ද, 2015 වසරේ පැමිණිලි 1 ක් ද, 2016 වසරේ පැමිණිලි 3 ක් ද, 2017 වසරේ පැමිණිලි 1 ක් ද සහ 2018 වසරේ පැමිණිලි 2 ක් ද වශයෙන් මුළු පැමිණිලි 11 ක් ද මණ්ඩලයට ලැබුණි.

ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අවස්ථා ගණනාවක දී අදාළ සඟරාවේ ලිපිනය ලබා ගැනීමක් සිදු කළ ද විවිධ අවස්ථාවල පුවත්පත විසින් ලිපිනයන් වෙනස් කිරීම හේතු කොටගෙන අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්ව මෙම "ඊතලය" පුවත්පත සම්බන්ධ පැමිණිලි ඉදිරියට ගෙන යන ලදී.

ඒ අනුව මේ වන විට මෙම පැමිණිලි 11 සම්බන්ධවම ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අභියාචනා අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත.

මණ්ඩලය වෙත ලද මුළු පැමිණිලිවල මූලයන් පහත පරිදි බෙදා දැක්විය හැකි ය:-

1. පුද්ගලයන්
2. ආයතන ප්‍රධානීන් /අමාත්‍යාංශ ලේකම්වරුන්
3. කථිකාචාර්යවරුන්
4. වෛද්‍ය නිලධාරින්, වෙනත් වෘත්තිකයින්
5. පූජක පක්ෂය
6. ගුරු මහත්ම, මහත්මීන්
7. සමිති සමාගම්
8. විවිධ දේශපාලන පක්ෂ නායකයින්, කණ්ඩායම්

2020 වර්ෂයේ ලද පැමිණිලි 71 පහත දැක්වෙන පුවත්පත් අයිතිකරුවන්ට විරුද්ධව ඉදිරිපත් කර තිබුණි:-

අයිතිකරුගේ නම

1. සී.ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
2. සී.ස. උපාලි පුවත්පත් සමාගම
3. සී.ස. විජය පුවත්පත් සමාගම
4. රිවිර පුවත්පත් ආයතනය
5. "ඊතලය" පුවත්පත් ආයතනය
6. "රාවය" පබ්ලිෂර් ගරන්ටි ලිමිටඩ් ආයතනය
7. සිලෝන් නිව්ස් පේපර්ස් පුද්ගලික සමාගම
8. "ලංකා ඉරිදා සංග්‍රහය" පුවත්පත් ආයතනය
9. ලිබර්ටි පබ්ලිෂර් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම
10. "උදයන්" පුවත්පත් සමාගම

පුවත්පත් ලියාපදිංචි කිරීම

2020 වසරේ මණ්ඩලයේ ලියාපදිංචි පුවත්පත් සංඛ්‍යාව 192 ක් වේ.

05. අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නිකුත් කරනු ලබන විධාන

සමාලෝචිත කාලය තුළ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නියෝග නිකුත් නොකළේය.

06. මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

2020 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා පවත්වන ලද ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළු පාසල් මාධ්‍යවේදී වැඩමුළු සහ මාසික දේශන වැඩසටහන් පහත සඳහන් පරිදි වේ. කෙසේ වෙතත් මෙම වසර තුල වැඩි කාලයක් රටතුළ කොවිඩ් වසංගත තත්ත්වය ව්‍යාප්තව පැවති හෙයින් අපේක්ෂිත අන්දමේ වැඩසටහන පැවැත්වීමට නොහැකි විය.

දිනය	වැඩමුළුව	සහභාගි වූ මාධ්‍යවේදීන් පාසල් සිසුන් ගුරුවරුන් සංඛ්‍යාව	ස්ථානය
2020.02.07	ගලහිටියාව මධ්‍ය මහා විද්‍යාලීය සිසුන් වෙනුවෙන් පාසල් මාධ්‍ය වැඩමුළුව	23	ශ්‍රී ලංකා පුවත් ලංකා පුවත්පත් මණ්ඩලය
2020.02.14	මධ්‍යම පළාත් ගුරු වැඩමුළුව	67	අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය
2020.02.27	පානදුර අධ්‍යාපන කලාප පාසල් මාධ්‍ය වැඩමුළුව	558	පානදුර බාලිකා විද්‍යාලය
2020.09.25	ගුරු වැඩමුළුව		"Oak Ray" ආයතනය
2020.12.21	ජනමාධ්‍යවේදීන්ගේ දරුවන් සඳහා නොමිලේ පාසල් උපකරණ ලබා දීම		ශ්‍රී ලංකා පදනම් ආයතනය

මාධ්‍ය අධ්‍යයනය හා පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව -2020 වසර

ඩිප්ලෝමාධාරීන් 41 දෙනෙකුගේ පමණ විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීම අරමුණු කර 2019 වර්ෂයේ ආරම්භ කරන ලද ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සිදුකිරීම.

පුවත්පත් කලාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව -2020 වසර

පාඨමාලා අපේක්ෂකයින් 22 දෙනෙකුගේ පුවත්පත් කලාව පිළිබඳව දැනුම වර්ධනය කිරීම අරමුණු කරගනිමින් පුවත්පත් කලාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවේ අවසාන විභාගය 2020.08.16 දින පැවැත්විය.

සිකුරාදා දිනවල පැවැත්වෙන සන්නිවේදන කතිකාවත -2020 වසර

කාලීන වශයෙන් වැදගත් ප්‍රකාශනයන් ඉලක්ක කර සන්නිවේදන කතිකාවත නම් සාකච්ඡාමය වැඩසටහනක් සෑම අඟහරුවාදා දිනකම පස්වරුවේ පවත්වන ලදී. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මෙම වැඩසටහන් 08ක් පවත්වන ලදී.

07. මුදල්

I 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. 32,500,000/- ක මුදලක් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අනුමත කරන ලදී. මෙම මුදලින් රු. 30,796,000/-ක මුදලක් මණ්ඩලයේ වියදම් සඳහා වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් මාසික වාරික වශයෙන් ලබා ගන්නා ලදී.

II 2020 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 1,000,000/- ක මුදලක් මහා භාණ්ඩාගාරයේ වැය ශීර්ෂය යටතේ අනුමත කළ අතර මෙම මුදල මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගන්නා ලදී.

III රජයේ දායකය සහ පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු හැරුණු විට 2020 වර්ෂය තුළදී මණ්ඩල අරමුදලට බැර කරන ලද ලැබීම් මෙසේය.

වෙනත් ලැබීම් (විලම්භීත ආදායම හැර)	රු.	807,301.61
ප්‍රමාද ගාස්තු ආදායම්	රු.	162,600.00
		969,901.61

IV මූල්‍ය කාර්ය සාධන වාර්තාව

පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ද ඇතුළුව වර්ෂය තුළ මුළු ආදායම රු. 34,994,449.09 ක් වූ අතර මුළු වියදම රු. 31,021,388.76 ක් විය. වර්ෂය සඳහා අතිරික්තය රු. 3,973,060.33 ක් 2020 වර්ෂයේ දී මණ්ඩල අරමුදලට හර කරන ලදී.

V මණ්ඩල සමුච්චිත අරමුදල

2020 වර්ෂය ආරම්භයේ දී මණ්ඩල අරමුදලේ බැර ශේෂය රු. 8,580,920.30 කි. වර්ෂය ආරම්භයේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 2,492,117.27 කි. වර්ෂය තුළදී ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම සඳහා ලද මුදල රු. 1,000,000/- කි. වර්ෂය සඳහා ප්‍රාග්ධන ක්‍රම ක්ෂය රු. 2,653,547.48 කි. මෙම වසරේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 838,569.79 ක් විය. වර්ෂය තුළ වියදම ඉක්ම වූ අතිරික්තය රු. 3,973,060.33 ක් සහ කලින් වර්ෂයට ගැලපුම් වෙනුවෙන් රු. (314,964.50) ක් මණ්ඩල අරමුදලට මාරු කිරීමෙන් පසු වර්ෂය අවසානයේ මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය රු.19,126,742.64 ක් විය.

මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය ද, ප්‍රාග්ධන අරමුදලේ බැර ශේෂයද, පාරිතෝෂික අරමුදල සඳහා වෙන් කිරීම් වන රු. 4,794,642.50/- ක් සහ ප්‍රවර්තන බැරකම් වන රු. 871,733.92 ක්ද ඇතුළුව මුළු වගකීම් ප්‍රමාණය ස්ථාවර වත්කම් වන රු. 8,396,301.35 ක් පර්යේෂණ, ණය අරමුදල් හා වෙනත් තැන්පත් රු. 5,349,836.91 ක් හා ප්‍රවර්තන වත්කම් රු. 11,046,980.80 ක් මගින් නියෝජනය වේ.

VI <u>පුවත්පත් ලියාපදිංචි කිරීම</u>

2020 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 575,000/- ක් ලැබුණි.

08. ස්තුතිය

මුදල් අමාත්‍යාංශයෙන් ලැබුණු නිවැරදි උපදෙස් සහ සහයෝගය මෙන්ම වගකීම් හා යුතුකම් ඉටු කිරීමේදී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල කාර්ය මණ්ඩලයේ සියලුදෙනා විසින් දක්වන ලද ඇප කැපවීමද අගය කරමි.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහින්ද පතිරණ,
සභාපති.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
155/15, කාසල් වීදිය,
බොරැල්ල, කොළඹ 08.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)	සටහන	2020	2019
ආදායම			
ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන	3	30,796,000.00	30,599,000.00
පුවත්පත් ලියාපදිංචි ගාස්තු		575,000.00	439,000.00
ඡායා පිටපත් ගාස්තු		320.00	4,138.00
ප්‍රමාද ගාස්තු		162,600.00	81,500.00
විවිධ තැන්පතු / ආදායම්	4	2,653,547.48	2,577,148.42
පොත් අලෙවිය	5	(14,768.44)	(108,653.67)
ඩිප්ලෝමා පාඨමාලා ආදායම		540,000.00	783,000.00
පොළී ආදායම - කාර්යමණ්ඩල ණය		75,629.42	89,729.95
පොළී ආදායම - ඉතුරුම් ගිණුම		206,120.63	206,279.96
මුළු ආදායම		**34,994,449.09**	**34,671,142.66**
වියදම්			
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	6	15,017,868.65	14,345,792.81
සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	7	1,219,696.79	1,697,207.47
දේපල පිරියත සහ උපකරණ ක්ෂයවීම්	16	2,986,381.61	2,377,238.33
උපයෝගිතා වියදම්	8	5,475,651.61	5,419,121.70
වෙනත් මෙහෙයුම් වියදම්	9	3,831,271.01	5,103,225.20
ප්‍රදාන සහ හුවමාරු ගෙවීම්	10	2,490,519.09	4,240,940.26
මුළු වියදම්		**31,021,388.76**	**33,183,525.77**
බදු පෙර අතිරික්තය/(හිඟය)		**3,973,060.33**	**1,487,616.89**
ආදායම් බදු වියදම්		-	-
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)		**3,973,060.33**	**1,487,616.89**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

	සටහන	2020	2019
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	11	6,308,138.62	2,716,484.19
ලැබිය යුතු ආදායම්	12	195,870.00	68,675.70
තොග ලේඛනය	13	628,887.01	861,978.61
තැන්පතු සහ කලින් ගෙවීම්	14	1,093,783.42	1,167,767.48
ලැබිය යුතු ආපදා ණය	15	2,820,301.75	2,214,070.70
		11,046,980.80	**7,028,976.68**
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	16	8,396,301.35	8,865,314.74
ආයෝජන - ඉතුරුම් ගිණුම් (අරමුදල් වෙනුවෙන්)	17	5,349,836.91	5,670,710.41
		13,746,138.26	**14,536,025.15**
මුළු වත්කම්		**24,793,119.06**	**21,565,001.83**
වගකීම්			
ජංගම වගකීම්			
විවිධ ණයහිමියෝ		7,000.00	28,000.00
උපචිත වියදම්	18	864,733.92	2,250,203.76
		871,733.92	**2,278,203.76**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	19	4,794,642.50	4,098,760.50
රජයේ භාණ්ඩාගාරය මගින් හඳුන්වාදුන් ප්‍රාග්ධනය		838,569.79	2,492,117.27
		5,633,212.29	**6,590,877.77**
මුළු වගකීම්		**6,504,946.21**	**8,869,081.53**
ශුද්ධ වත්කම්		**18,288,172.85**	**12,695,920.30**
ශුද්ධ වත්කම් / කොටස් ප්‍රාග්ධනය			
ප්‍රාග්ධන සංචිත		4,115,000.00	4,115,000.00
ප්‍රත්‍යාගනන සංචිත		1,934,156.72	-
සමුච්චිත අතිරික්ත /(හිඟ)		12,239,016.13	8,580,920.30
		18,288,172.85	**12,695,920.30**

පිටු අංක 06 සිට 17 දක්වාවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත.

.....

සකස් කළේ
ගණකාධිකාරී.
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ සියලු වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලක මණ්ඩලය සතු වේ.

පාලක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

.....

පුවත්පත් කොමසාරිස්
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

.....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

.....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික.

.....
සභාපති
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2021 පෙබරවාරි 23

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වත්කම්/කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

	දායක ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිතය	ප්‍රත්‍යාගනන සංචිතය	සමුච්චිත අතිරික්ත /(හිඟය)	එකතුව
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,661,626.75**	**4,115,000.00**	**-**	**7,727,275.49**	**15,503,902.24**
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම් (සටහන A)	-	-	-	**(633,972.08)**	**(633,972.08)**
භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්	1,700,000.00	-	-	-	**1,700,000.00**
ප්‍රාග්ධන සංචිතයට මාරුකිරීම්	-	-	-	-	-
රජයේ දායකය ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම (ක්‍රම ක්ෂය සඳහා)	**(2,869,509.48)**	-	-	-	**(2,869,509.48)**
වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය)	-	-	-	1,487,616.89	**1,487,616.89**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,492,117.27**	**4,115,000.00**	**-**	**8,580,920.30**	**15,188,037.57**
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම් (සටහන B)	-	-	-	**(314,964.50)**	**(314,964.50)**
භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්	**1,000,000.00**	-	-	-	**1,000,000.00**
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය	-	-	**1,934,156.72**	-	**1,934,156.72**
රජයේ දායකය ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම (ක්‍රම ක්ෂය සඳහා)	**(2,653,547.48)**	-	-	-	**(2,653,547.48)**
වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය)				**3,973,060.33**	**3,973,060.33**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**838,569.79**	**4,115,000.00**	**1,934,156.72**	**12,239,016.13**	**19,126,742.64**

(සම්බන්ධයි.....)

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වත්කම්/කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

සටහන් A - ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම

වර්ෂය තුළදී මණ්ඩල අරමුදලට පහත ගැලපුම් සිදුකර ඇත	රු. ශත
පත්තර ලියාපදිංචි කිරීම් ආදායම් 2017-2018	82,000.00
ආර්. ටී. අයි. ගාස්තු	14.00
දුරකථන බිල්පත් - සභාපතිතුමා	(4,545.89)
2018 දෙසැම්බර් වැටුප් ගණකාධිකාරි (වැ බ)	(10,540.25)
අඩුවෙන් වෙන් කිරීම්- විගණන ගාස්තු	(1,517,364.00)
මාධ්‍ය ශබ්දකෝෂය පිරිවැය 2018/2017	366,953.00
මාධ්‍ය සමීක්ෂා III නැවත මුද්‍රණය පිටපත් 500 ක් මුද්‍රණය	157,150.00
ප්‍රාග්ධන ක්‍රමසෂ අඩුවෙන් අගය කිරීම	292,361.06
	(633,972.08)

සටහන් B - ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම

	රු. ශත
පත්තර ලියාපදිංචි කිරීම් ආදායම් 2018-2019	8,000.00
පුවත්පත් විකුණුම්	3,952.50
කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණය	55,000.00
අඩුවෙන් වෙන් කිරීම්- විගණන ගාස්තු	(117,570.00)
ක්ෂයවීම්- කාර්යාලයීය හා සුභසාධන උපකරණ ආරම්භක ශේෂය නිවැරදි කිරීම	(3,272.91)
ක්ෂයවීම් - කාර්යාලයීය ලී බඩු හා සවිකිරීම් ආරම්භක ශේෂය නිවැරදි කිරීම	(98,779.09)
ක්ෂයවීම් - වාහන ආරම්භක ශේෂය නිවැරදි කිරීම	(162,000.00)
ක්ෂයවීම් - පුස්තකාල පොත් ආරම්භක ශේෂය නිවැරදි කිරීම	(300.00)
පොත් තොග- ආරම්භක ශේෂය නිවැරදි කිරීම	5.00
	(314,964.50)

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)	සටහන	2020 රු. ශත	2019 රු. ශත
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		3,973,060.33	1,487,616.89
ගැලපුම්			
ක්ෂයවීම්		2,986,381.61	2,377,238.33
කපාහැරීම්		12,776.50	9,495.41
පෙර වර්ෂයේ ගැලපුම්		(314,964.50)	(633,972.08)
ප්‍රවර්තන වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීම්		695,882.00	1,008,897.50
වැරදි නිවැරදි කිරීම් - ක්ෂය වෙන්කිරීම්		264,352.00	-
ප්‍රාග්ධන ක්‍රම ක්ෂය		(2,653,547.48)	(2,869,509.48)
මෙම වසරේ පොලී ආදායම්		(206,120.63)	(296,009.91)
කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභ		**4,757,819.83**	**1,083,756.66**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
ලැබිය යුතු ආදායම් (වැඩිවීම්) / අඩුවීම්		(127,194.30)	558.34
භාණ්ඩ ලේඛනවල (වැඩිවීම්) / අඩුවීම්		233,091.60	(28,011.29)
තැන්පතු සහ කලින් ගෙවීම් (වැඩිවීම්) / අඩුවීම්		73,984.06	(50,578.02)
ලැබිය යුතු ආපදා ණය (වැඩිවීම්) / අඩුවීම්		(606,231.05)	128,158.00
විවිධ ණයහිමියන්ගේ වැඩිවීම් / (අඩුවීම්)		(21,000.00)	22,000.00
උපචිත වියදම්වල වැඩිවීම් / (අඩුවීම්)		(1,385,469.84)	1,727,917.72
මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්		**2,925,000.30**	**2,883,801.41**
මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්			
ගෙවූ පාරිතෝෂික		-	(702,440.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**2,925,000.30**	**2,181,361.41**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
මිලදී ගත් ස්ථාවර වත්කම්		(860,340.00)	(1,468,115.80)
අරමුදල්වල ආයෝජන		320,873.50	(587,498.43)
පොලී ආදායම්		206,120.63	296,009.91
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායාම්)		**(333,345.87)**	**(1,759,604.32)**
මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය			
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන /:වෙත කරන ලද ආපසු ගෙවීම්)		1,000,000.00	1,700,000.00
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායාම්)		**1,000,000.00**	**1,700,000.00**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වර්ධනය / අඩුවීම		**3,591,654.43**	**2,121,757.09**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		**2,716,484.19**	**594,727.10**
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**6,308,138.62**	**2,716,484.19**

1 සංස්ථාපනය සහ නෛතික වයුහය

1973 අංක 5 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය නො. 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 යන ලිපිනයෙහි සිය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා ස්ථානය පවත්වාගෙන යනු ලබයි.

1.1 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

පුවත්පත් නිදහස ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා වන සංස්කෘතිකාංගයක් ලෙස ප්‍රචලිත කිරීම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යයයි.

1.2 ගිණුම් වාර්තා සැකසීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිත කළ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. විශේෂයෙන් සඳහන් කර නොමැති නම් එම ප්‍රතිපත්තීන් ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇති සෑම වර්ෂයකදීම භාවිත කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (ICASL) විසින් ඒකාබද්ධව ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුව සකස් කර ඇත.

1.4 අඛණ්ඩභාවය

මණ්ඩලයට නුදුරු අනාගතය තුළ තම මෙහෙයුම් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ඇති බවට පාලක මණ්ඩලය සෑහීමකට පත්වේ. එබැවින් අඛණ්ඩභාවය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

1.1.2 සන්සන්දනාත්මක තොරතුරු

මණ්ඩලය නියත වශයෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත්තේ ආයතනය විසින් අඛණ්ඩව භාවිත කර ඇති පෙර වර්ෂයන්හි භාවිත කළ ප්‍රතිපත්ති හා අනුකූලව වේ. ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවකදීම පසුගිය වර්ෂයේ සංඛ්‍යා සම්බන්ධ කර ගෙන තිබේ.

1.1.3 යෝග්‍ය බව සහ සමූහනය

සමාන අයිතම කාණ්ඩයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇති අතර අසමාන අයිතම හෝ කාර්යයන් අදාළ වේ නම් පමණක් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

1.1.4 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයන්හි භාවිත කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සෑම කාල සීමාවකටම අදාළ කර ගෙන ඇත.

2.1 දේපළ, යන්ත්‍ර සහ උපකරණ

2.1.1 හඳුනා ගැනීම සහ ප්‍රමාණනය

මෝටර් රථ හැර සියලුම යන්ත්‍ර සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානි සඳහා වන අගයන් අඩුකිරීමෙන් පසු දක්වා ඇත. ප්‍රත්‍යාගනන දින වන විට මෝටර්රථවල සාධාරණ අගය ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවල අගයන්ට වඩා අඩු බැවින් ඒවා ප්‍රත්‍යාගනන අගයට සටහන් කර ඇත. දේපල, යන්ත්‍ර සහ උපකරණවල පවතින අගයන් අයකරගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී ඒවා විය හැකි හානි සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් මූලිකවම පිරිවැය මත වාර්තා කර ඇත. දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගනනය කරන අවස්ථාවන්හිදී සම්පූර්ණ කාණ්ඩයම සාධාරණ අගය මත ප්‍රත්‍යාගනනය කර ඇත. ප්‍රත්‍යාගනනයන් නිසි පරිදි කලින් කලට සිදුකර ඇත. වත්කමක් ප්‍රත්‍යාගනනය කරන අවස්ථාවේදී පවතින අගයෙහි

සිදුවන වැඩිවීමක් ඍජුවම ප්‍රත්‍යාගනන සංචිතයට බැර කරනු ලැබේ. අදාළ වත්කමෙහි පූර්ව අතිරික්තය ඉක්මවන ප්‍රත්‍යාගනන හිඟයක් ප්‍රත්‍යාගනන සංචිතයේ අතිරික්තය ඉදිරියේ සටහන් කෙරෙන අතර ඕනෑම අතිරික්තයක් වියදමක් ලෙස හඳුනා ගැනේ. වත්කම් බැහැර කිරීමේදී විකුණන වත්කම්වලට අදාළ ප්‍රත්‍යාගනන සංචිතයක් රඳවාගත් ඉපයුම්වලට මාරු කරනු ලැබේ. දේපල, යන්ත්‍ර සහ උපකරණවලින් තවදුරටත් ආර්ථික වාසි බලාපොරොත්තු නොවන අවස්ථාවන්හිදී එම අයිතමයන් ප්‍රතිස්ථාපනය හෝ බැහැර කිරීම මගින් ඉවත් කරනු ලැබේ. එම වත්කම ඉවත් කිරීමෙන් ලද ලාභ හෝ පාඩු අදාළ වත්කම ඉවත් කළ වසරේ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත.

2.1.2 ක්ෂයවීම්

නිරවුල් ඉඩම් හැර සියලුම දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ සඳහා ඒවායේ ඇස්තමේන්තුගත සඵල ආර්ථික කාලය පුරා කපා හැරෙන ලෙසට ඍජු ක්‍රමයක් භාවිතයෙන් පිරිවැය හෝ තක්සේරුව මත ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත සඵල කාලය පහත පරිදි වේ.

වත්කම් වර්ගය	වසර
මෝටර් රථ - (10%)	10
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් - (20%)	05
කාර්යාල සහ සුභ සාධන උපකරණ - (20%)	05
පුස්තකාල පොත් - (20%)	05

වත්කම්වල සඵල කාලය සහ ශේෂ වටිනාකම සමාලෝචනය කෙරෙන අතර අවශ්‍ය නම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ ගැලපුම් සිදු කෙරේ. වත්කම භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය ගිණුම්ගත කිරීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වේ.

2.2 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යන්නෙන් ඉක්මනින් මුදල් බවට පත් කළ හැකි සහ වටිනාකමේ වෙනස්වීම්වලට භාජනය වීම ඉතා අඩු එනම්, අතැති මුදල්, ඉල්ලුම් තැන්පතුව සහ ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් කෙටිකාලීන ආයෝජන අර්ථ නිරූපණය කෙරේ.

2.3 ආයෝජන

ආයෝජන ඉතුරුම් තැන්පතුවලින් සමන්විත වන අතර මෙම ආයෝජන පිරිවැය මත ගිණුම් තබා ඇත.

2.4 තොග ලේඛනය

තොගය, ප්‍රකාශන සහ ලිපිද්‍රව්‍යවලින් සමන්විත වේ. ප්‍රකාශණ ගිණුම් තැබීම සිදු කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්දි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට වේ.

2.5 වෙනත් ලැබීම්

වෙනත් ලැබීම් ලබා ගැනීමට අපේක්ෂිත වටිනාකමට සඳහන් කර ඇත. ඩිප්ලෝමා පාඨමාලාවෙන් ලැබිය යුතු මුදල් හැර වෙනත් සියලු ලැබීම් උපචිත පදනම මත ගිණුම් තබා ඇත.

2.6 වගකීම් සහ ප්‍රතිපාදන

අතීත සිදුවීමක් තුලින් වර්තමාන බැඳීමක් පැහැනගින අවස්ථාවල සහ එය ඉටුකිරීම තුලින් ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත්වල ගලායාමක් බලාපොරොත්තුවන අවස්ථාවලදී ශේෂ පත්‍රය තුළ වගකීම් ඇතුළත් කෙරේ. ණයහිමියාගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවා නිම කළ යුතු බැඳීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත. ශේෂ පත්‍ර දිනයේ සිට වසරකට පසු ගෙවා නිම කළ හැකි වගකීම් ජංගම නොවන වගකීම් ලෙස සළකනු ලැබේ.

සමාගමට පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ අනුමිත වගකීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලායාම පිළිබඳ පිළිගත හැකි ඇස්තමේන්තුවක් සිදුකළ යුතු අවස්ථාවකදී ශේෂ පත්‍රය තුළ ප්‍රතිපාදනයක් ඇතුළත් කෙරේ.

2.7 සේවක ප්‍රතිලාභ

2.7.1 නිශ්චිත දායක සැලසුම්

මණ්ඩලයේ සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි සාමාජිකයන් වන අතර මණ්ඩලය විසින් එම අරමුදල් සඳහා සේවකයන්ගේ මූලික වැටුපෙන් පිළිවෙලින් 15% ක් සහ 3% ක් වශයෙන් දායක මුදල් ගෙවනු ලැබේ.

2.7.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

පාරිතෝෂික නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් වේ. පනතට අනුකූල කාලසීමාව තුළ ගෙවීම් කිරීමට මණ්ඩලය නිත්‍යානුකූලව බැඳී සිටී. නිසි පරිදි යෝග්‍ය ලෙස වෙන් කරන ලද ඉදිරියට ගෙන යන මෙම වගකීම මූල්‍ය ප්‍රකාශණ මගින් ඉදිරිපත් කර ඇත. පාරිතෝෂික ගණනය කරනු ලබන පදනම වන්නේ එක් එක් පුද්ගලයා ප්‍රවර්ථන වර්ෂයේ අවසාන මාසයේ ගන්නා ලද වැටුපෙන් අඩක වටිනාකම එක් ලිත් වර්ෂයක් සඳහා වන පරිදි කරන ලද සේවා කාලයෙන් ගුණ කිරීමෙනි. ආයතනයෙන් ඉල්ලා අස්වූ විගසම මෙම මුදල ලබා ගැනීම සෑම දෙනෙකුගේම අපේක්ෂාව වේ. ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරියට ගෙන එන ලද වෙන් කිරීම්,වර්ෂයේ ගෙවීම්,ඉදිරියට ගෙන යන වෙන් කිරීම් අතර වෙනස ආදායම් වියදම් ගිණුමෙන් ගලපනු ලැබේ. පාරිතෝෂික වගකීම ආයු ගණනය අගය කර නැති අරමුදලක් නොවේ.

2.8 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

2.8.1 ආදායම් හඳුනා ගැනීම

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන සහ ආදායම හා ඒ වෙනුවෙන් දරනු ලැබූ හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය සත්‍ය ලෙසම ගණනය කළ හැකි අවස්ථාවන්හිදී එය ආදායමක් ලෙස හඳුනා ගැනේ. ආදායම ගණනය කිරීම ලැබූ හෝ ලැබීමට නියමිත ප්‍රතිඵලයාවෙහි සාධාරණ අගය, වෙළඳ වට්ටම් සහ වෙළඳ බදු මත සිදු කෙරේ.

2.8.2 රජයේ දායකත්වය

රජයේ දායකත්වය මතුපිටින් පෙනෙන ලැබීමක් පමණක් ලෙස මූල්‍ය ප්‍රකාශණ වලින් හඳුනා ගැනෙන අතර ශේෂ පත්‍රයෙහි ජංගම නොවන වගකීමක් ලෙස හා විලම්බිත ආදායමක් ලෙස පෙන්නුම් කෙරේ. දරන ලද වියදමේ හිමිකමට එරෙහි රජයේ දායකය සහ ප්‍රයෝජනයට නොගන්නා අගය ශේෂ පත්‍රයෙන් පෙන්නුම් කෙරේ.

රජයේ දායකයට සම්බන්ධ දේපල,පිරියත සහ උපකරණ ආදායමෙන් වෙන් කරන ලද ක්‍රමානුකූල පදනමට පහත පරිදි සරල මාර්ග ක්‍රමයට ගණනය කරනු ලැබේ.

මෝටර් රථ	10%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	20%
කාර්යාල සහ සුභ සාධන උපකරණ	20%
පුස්තකාල පොත්	20%

2.8.3 පොළී ආදායම

පොළී ආදායම ලාභයේදී හෝ පාඩුවේදී උපචිත වන විට ඵලදායී පොළී ක්‍රමය මගින් හඳුනා ගැනීම සිදු කෙරේ.

2.8.4 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.8.5.1 වියදම් හඳුනා ගැනීම

මණ්ඩලයේ ඒදිනෙදා මෙහෙයුම් කටයුතු සහ දේපළ, යන්ත්‍ර සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීම සඳහා දරන ලද සියලු වියදම් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත.

2.8.5.2 වියදම් වර්ගීකරණය

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේදී වියදමෙහි ස්වභාවය මත කරන වර්ගීකරණය මගින් මණ්ඩලයෙහි කාර්යසාධන මූලිකාංග වඩා හොඳින් ඉදිරිපත් වන්නේයැයි පාලක මණ්ඩලය අදහස් කළ හෙයින් එම ක්‍රමය භාවිත කරන ලදී.

2.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිලෙ කිරීමේදී 'වක්‍ර ක්‍රමය' භාවිත කර ඇත.

2.10 වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම්

වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම් යනු වාර්තා කිරීමේ කාලසීමාවේ අවසන් දිනයත් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලැබෙන දිනයත් අතර සිදුවන යහපත් හෝ අයහපත් සිදුවීම් වේ. වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම්වල උචිත බව සළකා බලා අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනයට ගැලපුම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

	2020	2019
සටහන 3 - ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වය	**30,796,000.00**	**30,599,000.00**
ශ්‍රී ලංකා රජයෙන් උපයෝගිතා සහ නඩත්තු සඳහා ලද ප්‍රතිපාදන නියෝජනය වේ.		
සටහන 4 - වෙනත් ආදායම්		
රජයේ දායකයෙන් ප්‍රාග්ධන ක්‍රම ක්ෂය	2,653,547.48	2,577,148.42
	2,653,547.48	**2,577,148.42**
සටහන 5 - පොත් අලෙවිය		
පොත් විකුණුම්	35,450.00	51,700.00
අඩු කළා - පොත් විකුණුම් පිරිවැය	(50,218.44)	(160,353.67)
	(14,768.44)	**(108,653.67)**
සටහන 6 - වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ		
වැටුප් සහ වේතන	10,984,358.52	9,605,348.41
සේ.අ. අරමුදල් දායකත්වය	1,595,233.18	1,308,627.98
සේ.භා. අරමුදල් දායකත්වය	319,046.63	261,725.62
අතිකාල සහ නිවාඩු දින වැටුප්	535,576.32	895,811.30
සාමාජික මුදල්	408,000.00	732,000.00
පාරිතෝෂික ප්‍රතිපාදන	695,882.00	1,008,897.50
විගණන කමිටු රැස්වීම් ගාස්තු	-	42,000.00
වෙනත් දීමනා	479,772.00	491,382.00
	15,017,868.65	**14,345,792.81**
සටහන 7 - සැපයුම් සහ අවශ්‍යතා		
ලිපිද්‍රව්‍ය	139,311.93	664,007.92
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	362,316.33	366,632.63
ඉන්ධන දීමනාව	468,120.16	488,390.00
යාන්ත්‍රික හා විදුලි උපකරණ	-	5,080.00
කාර්යාල අවශ්‍යතා	195,383.37	99,571.92
නිල ඇඳුම්	16,000.00	16,000.00
පුවත්පත් සහ වාර සඟරා	38,565.00	57,525.00
	1,219,696.79	**1,697,207.47**
සටහන 8 - උපයෝගිතා වියදම්		
දුරකථන ගාස්තු	181,523.27	204,695.77
දුරකථන දීමනා	164,950.93	172,601.58
තැපැල්	41,570.00	64,915.00
විදුලිය	532,706.40	635,789.25
කාර්යාල කුලී	3,660,000.00	3,326,400.00
ජල ගාස්තු	81,973.01	105,399.40
ආරක්ෂක වියදම්	744,552.00	771,714.00
අනුපාත හා බදු	68,376.00	137,606.70
	5,475,651.61	**5,419,121.70**

	2020	2019
සටහන 9 - වෙනත් මෙහෙයුම් වියදම්		
ප්‍රවාහන දීමනා	1,138,978.49	1,150,000.00
ගමන් වියදම් - නිලධාරි	47,890.00	87,600.00
ගමන් වියදම් - සාමාජික	49,152.00	69,456.00
ගමන් වියදම් - විදේශීය	-	745,186.76
දැන්වීම් සහ ප්‍රකාශන	281,736.90	394,025.45
මුද්‍රණ සහ පොත් බැඳීම්	50,037.50	171,034.72
පරිවර්තන	4,255.00	10,700.00
අළුත්වැඩියා සහ නඩත්තු	768,525.21	1,240,155.19
සංග්‍රහ වියදම්	147,431.75	273,286.40
තොග කපාහැරීම්	272,659.12	-
කාර්යාල හා සුභසාධන උපකරණ කපා හැරීම්	3,716.50	4,879.50
කාර්යාල ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් කපා හැරීම්	9,060.00	4,615.91
විගණන ගාස්තු	700,000.00	529,230.00
අනියම් වියදම්	35,000.00	63,180.00
බැංකු ගාස්තු	4,860.00	19,728.95
මෝටර් රථ රක්ෂණ සහ බලපත්‍ර	180,668.54	208,582.32
නීති ගාස්තු	112,600.00	108,264.00
වෙබ් අඩවි වියදම්	9,000.00	23,300.00
පැමිණිලි පිරිවැය	15,700.00	-
	3,831,271.01	**5,103,225.20**
සටහන 10 - ප්‍රදාන සහ මාරුකිරීම්		
පළාත් සන්නිවේදන වැඩමුළුව	581,718.75	2,318,005.07
ඩිප්ලෝමා පාඨමාලාව	355,234.00	1,246,731.89
සහතික පත්‍ර පාඨමාලාව	143,322.00	-
සංනිවේදන කතිකාවත	12,289.00	20,930.00
ප්‍රකාශන හා පර්යේෂණ	573,910.00	133,400.00
රචනා තරගය	-	241,073.30
පුහුණු පාඨමාලාව - නිලධාරි	-	105,800.00
සුභසාධන සමිතිය සඳහා අත්තිකාරම්	-	25,000.00
ජනමාධ්‍යවේදී සුබසාධන පහසුකම්	802,897.77	150,000.00
පරිත්‍යාග	21,147.57	-
	2,490,519.09	**4,240,940.26**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිත .....)
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	2020	2019
සටහන 11 - මුදල් සහ මුදල් සමාන දෑ		
බැංකුවේ මුදල්	6,308,138.62	2,716,484.19
	6,308,138.62	**2,716,484.19**
සටහන 12 - වෙනත් ජංගම වත්කම්		
පොත් අලෙවිය	6,370.00	6,370.00
පුවත්පත් ලියාපදිංචි ගාස්තු	86,000.00	-
පුවත්පත් ලියාපදිංචි ප්‍රමාද ගාස්තු	103,500.00	-
වැටුප් හා වේතන	-	1,161.70
දුරකථන අවකරණ	-	1,798.00
ඩිප්ලෝමා සහතික පත්‍ර තැන්පත් මුදල්	-	59,346.00
	195,870.00	**68,675.70**
සටහන 13 - තොග ලේඛනය		
පොත් තොග	304,728.38	639,061.19
ලිපිද්‍රව්‍ය තොග	226,112.53	115,184.00
විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ තොග	98,046.10	107,733.42
	628,887.01	**861,978.61**
සටහන 14 - තැන්පතු සහ අත්තිකාරම්		
ආරක්ෂක තැන්පතුව - කාසල් වීදිය ගොඩනැගිල්ල	831,600.00	831,600.00
ආරක්ෂක තැන්පතුව - ජල බෝතල්	7,200.00	7,200.00
ඉන්ධන තැන්පතුව	75,000.00	75,000.00
රක්ෂණ සහ ආදායම් සහතික ගාස්තු	169,983.42	253,967.48
ආපසු ගෙවීමේ තැන්පතු මුදල්	10,000.00	-
එකතුව	**1,093,783.42**	**1,167,767.48**
සටහන 15 - ලැබිය යුතු ආපදා ණය		
වර්ෂය ආරම්භයේ ශේෂය	2,214,070.70	2,342,228.70
වර්ෂය තුළ ලබා දුන් ණය	862,895.30	446,601.30
	3,076,966.00	**2,788,830.00**
වර්ෂය තුළ අයකරගත් ණය	(256,664.25)	(574,759.30)
වර්ෂය අවසානයේ ශේෂය	**2,820,301.75**	**2,214,070.70**

සටහන 16 - දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ

	මෝටර් රථ	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	කාර්යාල සහ සුභ සාධන උපකරණ	පුස්තකාල පොත්	එකතුව
පිරිවැය / ප්‍රත්‍යාගණනය					
2019 ජනවාරි 01 දිනට ශේෂය	**10,541,000.00**	**2,520,771.71**	**9,093,339.58**	**295,164.66**	**22,450,275.95**
ප්‍රත්‍යාගණනය කිරීම	-	(40,392.25)	(1,479,675.74)	-	**(1,520,067.99)**
එකතුකිරීම්	-	126,765.00	712,875.00	20,700.00	**860,340.00**
බැහැර කිරීම්/ කපාහැරීම්	-	78,716.50	207,820.00	-	**286,536.50**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,541,000.00**	**2,528,427.96**	**8,118,718.84**	**315,864.66**	**21,504,011.46**
ක්ෂයවීම්					
2019 ජනවාරි 01 දිනට ශේෂය	**7,533,800.00**	**1,491,519.03**	**4,369,067.83**	**190,574.35**	**13,584,961.21**
ආරම්භක ශේෂය ගැලපිම	162,000.00	3,272.91	98,779.09	300.00	**264,352.00**
ප්‍රත්‍යාගණනය කිරීම	-	(989,450.00)	(2,306,085.00)	(153,689.71)	**(3,449,224.71)**
වර්ෂය සඳහා	971,950.00	480,254.59	1,480,736.64	53,440.38	**2,986,381.61**
කපාහැරීම්		**(75,000.00)**	**(198,760.00)**	-	**(273,760.00)**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,667,750.00**	**910,596.53**	**3,443,738.56**	**85,625.02**	**13,107,710.11**
පවතින වටිනාකම					
2019 ජනවාරි 01 දිනට	**3,007,200.00**	**1,029,252.68**	**4,724,271.75**	**104,590.31**	**8,865,314.74**
2020 දෙසැම්බර් 31 දිනට	**1,873,250.00**	**1,617,831.43**	**4,674,980.28**	**230,239.64**	**8,396,301.35**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිත .....)	2020	2019
(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)		
සටහන 17 - ආයෝජන - ඉතුරුම් ගිණුම් (අරමුදල් සඳහා)		
මහජන බැංකුව - ණය අරමුදල	1,511,031.73	1,974,390.46
මහජන බැංකුව - පර්යේෂණ අරමුදල	3,838,805.18	3,696,319.95
	5,349,836.91	**5,670,710.41**
සටහන 18 - උපචිත වියදම්		
අනියම් වේතන	-	20,412.00
අතිකාල	26,990.01	38,724.13
ගමන් වියදම් - කාර්යාලය	-	400.00
දුරකථන	17,404.31	9,280.93
විගණන ගාස්තු	700,000.00	2,043,780.00
කාර්යාලීය අවශ්‍යතා	37,654.04	-
කාර්ය මණ්ඩලය සඳහා ආපදා ණය	3,607.50	-
ලිපිද්‍රව්‍ය	79,078.06	-
අනුපාත හා බදු	-	137,606.70
	864,733.92	**2,250,203.76**
සටහන 19 - සේවක ප්‍රතිලාභ		
වර්ෂය ආරම්භයේ ශේෂය	4,098,760.50	3,792,303.00
වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂික		(702,440.00)
	4,098,760.50	**3,089,863.00**
වර්ෂය තුළ වෙන් කිරීම් / (ඉවත්කිරීම්)	695,882.00	1,008,897.50
වර්ෂය අවසානයේ ශේෂය	**4,794,642.50**	**4,098,760.50**

සටහන 20 - සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු

මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරන නිලධාරීන් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන අතර ඔවුන් සමග සිදුවූ ගනුදෙනු පහත පරිදි වේ.

නම	සම්බන්ධතාවය	ගනුදෙනුවේ ස්වභාවය	වටිනාකම
ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා	අධ්‍යක්ෂක	මණ්ඩලය මගින් පවත්වනු ලබන ජනමාධ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ සමායෝජක ලෙස කටයුතු කිරීම	17,500.00

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩී/සී/එස්එල්පීසී/3/20/එන්ඒ/ IPSC මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 මැයි/ 19 දින

සභාපති
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

(i) ප්‍රමිතියේ 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත් වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් පන්තිය තුල, කාර්යාල හා සුභසාධක උපකරණ පන්තිය තුල සහ පුස්තකාල පොත් පන්තිය තුල පිරිවැය රු.6,957,152 ක් වන අයිතමයන් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) ප්‍රමිතියේ 90 ඡේදය ප්‍රකාරව රු.3,727,380 ක පිරිවැයක් සහිත දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේ දී ආයතනය විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම් කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ, පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 හා 134	මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් කර නොතිබුණි.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.10	මණ්ඩලය විසින් වර්තමාන සන්නිවේදන ප්‍රවණතා හා ජනතා අයිතිවාසිකම් පිළිබඳ සිදුකරන ලද ග්‍රාහක සමීක්ෂණය සිදුකිරීම සඳහා පුද්ගලික ආයතනයක් සමඟ රු.1,830,000 කට ගිවිසුම් ගතවී තිබුණ ද කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල ලිපියේ 1 ඡේදය සහ පොදු ව්‍යාපාරකාරක සභාවේ 2012 ජූලි 10 දිනැති අංක 7 නියෝගය	එම නියෝගය ප්‍රකාරව මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යායුතු වූවද, මණ්ඩලය ආරම්භයේ සිට වසර 21 ක පමණ කාලයක් කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිලි වල පවත්වාගෙන ගොස් තිබුණ අතර, ඒ වෙනුවෙන් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පමණක් ගොඩනැගිලි කුලී වශයෙන් රු.26,108 ,800 ක් වැයකර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ) පුවත්පත් මණ්ඩල පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව රීති හා නියෝග සම්පාදනය	ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය රීති හා නියෝග සම්පාදනයට කටයුතු කර නොතිබුණි.
(ආ) පුවත්පත් මණ්ඩල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් වලට හා කර්තෘවරුන් ආදීන්ට විරුද්ධව මණ්ඩලය විසින් ක්‍රියා කිරීම	සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතන වලින් ලද පැමිණිලි 71 ක් සහ 2019 වර්ෂයේ නොවිසඳී ඉදිරියට ගෙනා පැමිණිලි 62 ක් ද ඇතුළුව මුළු පැමිණිලි සංඛ්‍යාව 133 ක් වූ අතර ඉන් පැමිණිලි 69 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විසඳීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) පුවත්පත් මණ්ඩල පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව දඩ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව	සමාලෝචිත වර්ෂය තුලදී පුවත්පත් ලියාපදිංචි කිරීමේ ප්‍රමාද ගාස්තු වශයෙන් අය කරන ලද රු.59,100 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදුකෙරේ.

(i) සැලැස්මේ ඇතුළත් වූ වැඩ සටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කල යුතු පුවත්පත් සංඛ්‍යාව 250 ක් සහ ඇස්තමේන්තු ගත පුවත්පත් ලියාපදිංචි ආදායම රු.500,000 ක් වුව ද සත්‍ය වශයෙන්ම ලියාපදිංචි කල පුවත්පත් සංඛ්‍යාව 172 ක් වූ බැවින් පුවත්පත් 78 ක් සඳහා ලියාපදිංචි ආදායම හඳුනාගත යුතු වුවද පුවත් පත් 15 ක් සඳහා රු.86,000 ක් පමණක් ආදායම වශයෙන් හඳුනාගෙන තිබුණු අතර ඉතිරි පුවත්පත් 63 සඳහා ආදායම් හඳුනාගෙන නොතිබුණි.

(iii) එක් වැඩසටහනකට රු.50,000 බැගින් වන පරිදි මාධ්‍යවේදීන් සඳහා සුහසාධක වැඩසටහන් 10 ක් පැවැත්වීමට මණ්ඩලය සැලසුම්කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය තුල එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණු අතර ඒ සඳහා රු.802,897 ක් වැයකර තිබුණු බැවින් මණ්ඩලයේ ප්‍රගති වාර්තාවේ හි මූල්‍ය කාර්යසාධනය ලෙස සියයට 140 ක් පෙන්නුම් කළ ද එය අයවැයගත ප්‍රමාණය ඉක්මවා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් පිළිවෙලින් 1993 නොවැම්බර් 05 සහ 2009 සැප්තැම්බර් 07 දිනයන්හි ආරම්භ කරන ලද පර්යේෂණ අරමුදල සහ ණය අරමුදල සඳහා බැංකු ගිණුම් දෙකක් පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුම්වල ශේෂය පිළිවෙලින් රු.3,838 ,805 ක් සහ රු.1,511,031 ක් විය. අංක එෆ්අයිඑන්/පීඊඑන්/168 සහ 2017 දෙසැම්බර් 19 දිනැති මණ්ඩලයේ සභාපතිගේ ලිපිය මගින් මෙම අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඉල්ලා තිබුණද 2021 මාර්තු 10 දින වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි.

(ඇ) අයවැයගත හා නත්‍ය ආදායම් අතර සියයට 5 සිට සියයට 67 දක්වාත් අයවැයගත හා නත්‍ය වියදම් අතර සියයට 5 සිට සියයට 100 දක්වාත් විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදුකර පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ගිවිසුමකට එළඹ, ඒ වෙනුවෙන් රු.200,000ක අත්තිකාරම් මුදලක් කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන අංශය වෙත 2015 නොවැම්බර් 24 දින ගෙවා තිබුණු අතර, එම ගෙවීමෙන් මාසයක් ඇතුළත සමස්ත පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කළ යුතුව තිබුණ ද 2021 මාර්තු 10 දින වන විටත් එම වාර්තාව ඉදිරිපත්කර නොතිබුණි.

(ඉ) දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ දී ආයතනය විසින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් මේ සඳහා යොදාගෙන තිබූ අතර තක්සේරුකරණය පිළිබඳ එම කමිටුවේ සාමාජිකයන්ගේ දැනුම සහ සුදුසුකම් පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි බැවින් ප්‍රත්‍යාගණනය තුලින් පැන නැඟී ප්‍රත්‍යාගණන වටිනාකම් පිළිබඳ විගණනයේ දී ගැටළු සහගත විය.

(ඊ) 1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 ඒ දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන පුවත්පත් කලාවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට අනුව දිනපතා පළවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා ක්‍රමවේදයක් පැවතියද පළවන පුවත්පත් ප්‍රමාණයට සාපේක්ෂව සීමිත විමර්ශන වාර්තා ප්‍රමාණයක් පමණක් ඉදිරිපත් කර තිබුණු අතර එකී විමර්ශන වාර්තා සම්බන්ධයෙන් ද ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානය යොමුවී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති